# කොවිඩ්-19 අර්බුදය හමුවේ ඇඟලුම් සේවා සේවකයින්ගේ ඉල්ලීම පිළිබඳව AFWA ප්‍රකාශය.

කොවිඩ්-19 වසංගතය ආර්ථික හා කම්කරු අයිතිය මත කරන බලපෑම ගෝලියව පැතිර යන අතර එහි අතිමහත් අවදානමකට නිරාවරණය හා වැඩිම බරක් දැරීමට සිදුවී ඇත්තේ ගෝලියව සැපයුම් දාමයෙ සිටින ඇගලුම්  සේවකයන් හට බව අපට නිරීක්ෂණය වේ.ඇඟලුම් සන්නාම ඇණවුම් අවලංගු කිරීම සහ ගෙවීම් අතපසු කිරීම නිසා මෙම වසංගතය, කම්පනයක් බවට පත්ව ඇත.

මෙම බලපෑම හමුවේ, ඇගලුම් සපයන්නන් විසින් සමාජ ආරක්ෂණයක් හෝ වැටුප් සහිතව නිවාඩු රහිතව කර්මාන්තශාලා තුල සේවය අතහැරීම හෝ නැවැත්වීම නිසා මේවන විටත් අස්තාවරභාවයක සිටින ශ්‍රමිකයන් තවදුරටත් විශාල ආර්ථික අවදානමකට තල්ලු කරමින් සිටී.

මේ හා සමානව ම සිත් සසලවන වාර්තා වෙනත් රටවලින් වන අතර සේවායෝජකයන් ආරක්ෂක ක්‍රියාමාර්ග ගැනීමට අකමැති වීම නිසා ශ්‍රමිකයන් තවදුරටත් කර්මාන්ත ශාලා තුල සේවය කිරීමට ලක්වෙයි .මෙම හේතුවෙන් ශ්‍රමිකයන්, ඔවුන්ගේ පවුල් හා ප්‍රජාව මෙම ආසාදනයට ගොදුරුවීමේ අවදානමක සිටී .

මේ අතර ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) වැනි අන්තර්ජාතික සංවිධාන විසින් සමාජික රටවලින් ඉල්ලුමත යතාතත්වයට හා ඔරොත්තු දීමේ හැකියාව ඇති ජගත් සාමාජීය ආරක්ෂණ පද්ධතියක් ශක්තිමත් කරන ආකාරයේ සංස්ථාපිත හා ප්‍රතිපත්ති සංස්කරණ සිදු කරන ලෙස ඉල්ලා සිටීමත් ආසියාතික ඇගලුම් නිෂ්පාදන කරන රජයන්ගේ ප්‍රයත්නයන් විවිධාකාර වේ.

## I. ගෝලිය සැපයුම් දාමයේ නිෂ්පාදන රටවල්වල කොවිඩ්-19 අර්බුදය කෙරෙහි ප්‍රතිචාර

* ආසියාතික ඇගලුම් නිෂ්පාදනය රටවල් විසින් කොවිඩ්-19 සදහා ගන්නා ලද සංස්ථාපිත ප්‍රතිචාර මත ආකාර තුනක් හදුනාගත හැක.

1 රජය විසින් සෘජු සෞඛ්‍ය බලපෑම් අවම කිරීම සදහා දැඩි ක්‍රියාමාර්ග ගනිමින් ශ්‍රමිකයන් සදහා  ආර්ථිකමය ආධාර සපයයි. උදාහරණයක් ලෙස ලංකාවේ සමහර ප්‍රදේශවල කර්මාන්තශාලා රජයේ උපදෙස් මත වසා දමන ලද අතර ශ්‍රමිකයන් වැටුප් සහිත නිවාඩු හිමිකම ලබයි. තවමත් මෙහෙයුම් සිදු කරන කර්මාන්තශාලා ශ්‍රී ලංකා

රජයේ සෘජු නියෝග මත ප්‍රමාණවත් සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රියා මාර්ග ගතයුතුයි. ඉන්දියාවේ පසුගිය සතිය වනතුරුම කර්මාන්තශාලා වෘත්තීමය වශයෙන් කොවිඩ්-19 වසංගතය නිරාවරණය වැලැක්වීම සදහා ප්‍රමාණවත් පියවර රහිතව කටයුතු කෙරිණි. එනමුත් අද සිට ඉන්දීයාවේ බොහොමයක් ප්‍රාන්තවල කර්මාන්තශාලා මාර්තු 31 වන තෙක් රජයේ සෘජු නියෝග මත වසා දමා ඇත. මිට අමතරව ඉන්දියානු රජය විසින් මෙම අර්බුදය හමුවේ සේවකයන්ගේ වැටුප් අඩු කිරිම හෝ නවතා දැමිම සිදු නොකරන ලෙස නියෝග කර තිබේ. එමෙන්ම මෙම වසංගතය පාලනය කරන තෙක් වැටුප් සහිත නිවාඩු ශ්‍රමිකයන්ගේ හිමිකම කියාපායි .

2) රජයන් විසින් සෘජු සෞඛ්‍ය බලපෑම් පාලනය සදහා ස්වෙච්ඡා ආචාර ධර්ම සංග්‍රහයන් කර්මාන්තශාලා සදහා නිකුත් කරන අතර ශ්‍රමිකයන් සදහා ආර්ථික ආධාර පොරොන්දුවේ. උදාහරණයක් ලෙස කාම්බෝජයේ හා මියන්මාරයේ චිනයෙන් ලැබෙන අමු ද්‍රව්‍ය හිගය නිසා කර්මාන්තශාලා වසා දැම්මට සිදුවි ඇති අතර දහස් ගණනක් ශ්‍රමිකයනගේ රැකියා අහිමිවී ඇත. එසේම නවතා දමා ඇති කර්මාන්තශාලා විසින් 40% වැටුපක් ශ්‍රමිකයන් සදහා ගෙවිය යුතුය .මිට අමතරව කාම්බෝජ කම්කරු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෘදු කුසලතා වර්ධන වැඩසටහන් වල ලියාපදිංචි ශ්‍රමිකයන් සදහා වැටුපෙන් 20% රජය මගින් ලබාදේ. මියන්මාරයෙ වන්දි ලබා නොදි රැකියවෙන් බොහෝ සේවකයන් ඉවත් කර ඇති අතර මියන්මාර ආයෝජන කොමිසම (MIC) විසින් නිවේදනය කරන්නේ වැටුප් නොගෙවන කර්මාන්තශාලා තවදුරටත් මෙහෙයුම් කිරිම නවතන බවයි .

3) රජය විසින් සෘජු සෞඛ්‍ය බලපෑම් පාලනය යටතේ ස්වෙච්ඡා ආචාර ධර්ම සංග්‍රහයන් කර්මාන්තශාලා සදහා නිකුත්කරන මුත් ශ්‍රමිකයන් ආරක්ෂා කිරිම සදහා ආර්ථිකමය හෝ සේවක ප්‍රතිපත්ති සහතික කිරීමක් සිදු නොකිරීම .

උදාහරණයක් ලෙස ඉන්දුනීසියාවේ රජය විසින් සෞඛ්‍ය හා ආරක්ෂණ මාර්ගෝපදේශනයක් පමනක් තවදුරටත් ක්‍රියාත්මක කර්මාන්තශාලා වෙත නිකුත්කර ඇති අතර සමහර කර්මාන්තශාලා මෙම ආරක්ෂක පියවරක් සදහා අනුගතව ඇත. කොවිඩ්-19 නිසා වන ආසාදිතවීම පොදුවේ ගත්කල අවම කිරිම සදහා දිරිමත් කිරීමක් වන ආර්ථික ක්‍රියාකාරිත්වයේ අවශ්‍ය මුත් වැටුප් අහිමිවීම හා ආර්ථික ක්‍රියාකාරිත්වයේ බිද වැටීම පාලනය සදහා ගන්නා උත්සාහයන් ආසියාතික ඇගලුම් නිශ්පාදනය කරන රටවලට සීමා වී තිබේ .

ඇගලුම් ශ්‍රමිකයන්ගේ ඉල්ලීම් පද්ධතිය මිලියන 60 වන ඇගලුම් ශ්‍රමිකයන්ගේ ආදායම් අහිමිවීම පිලිබඳ රජය, සන්නාමයන් හා ඇගලුම් සපයන්නන් ස්ථිරසාර පියවරයන්

ගැනිම අවශ්‍ය වේ. එසේ නොමැතිව, යටිකුරු වූ ඉල්ලුම් කම්පනයක් ඇතිවීමේ අවදානම පවතින අතර එය දිගුකාලීන ආර්ථික අවපාතයක් දක්වා දිව යා හැක. වෙනත් ආකාරයකට පවසනවා නම්, කොවිඩ් - 19 අර්බුදය නිසා අපදාවකට ලක්වන ඇගලුම් ශ්‍රමිකයන්ගේ ආදායම් හා රැකියා ලබා දීමේ හැකියාව නොමැති විමෙන් විශමතාවය හා වැඩකරන දරිද්‍රතාවය පමනක් නොව අයිතම හා සේවා පාරිභෝජනය සැලකිය යුතු මට්ටමකින් පහල යා හැකියි. මෙය වේගවත් හා සාධාරණ ලෝක පුනර්ජීවය සදහා ඉතා අහිතකර වේ.

එපමනක් නොව, ප්‍රජා සෞඛ්‍ය පද්ධතිය කප්පාදු කිරීම නිසා මහජන ආයෝජන පහල යෑමෙන් විශාල රටවල් ප්‍රමාණයක් මේ මොහොතේ ප්‍රජා සෞඛ්‍ය අවදානමකට මුහුණ දී ඇත. මෙය වහා ප්‍රතිස්ථාපනය විය යුතුය. රජයන් ප්‍රතිපත්ති නියෝග නිකුත් කලයුතු අතර පොදු සම්පත් වෙන්කිරීම හා ප්‍රගමනික දේශපාලනමය කැමැත්ත මගින් වහා ප්‍රජා සෞඛ්‍ය පද්ධතිය විශාල කල යුතුය . එය කොවිඩ්-19 වයිරසය මගින් වන බිද වැටීම සදහා හදිසි වැඩපිළිවෙළක් කල යුතුය .

**1) රජයෙන් කරන ඉල්ලීම**

ඇගලුම් නිශ්පාදනය කරන රටවල් වල රජයන් විසින් කොවිඩ් -19 වසංගතයෙන් වෙන වන සෘජු හා වක්‍ර ප්‍රතිවිපාක මැඩ පැවත්වීම සදහා පහත නිර්දේශ අනුගමනය කල යුතුය .

a) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) නිර්දේශය හා මාර්ගෝපදේශනය අනුව කොවිඩ් - 19 සෘජු සෞඛ්‍ය බලපෑම්වලින් ඇගලුම් සේවකයන් ආරක්ෂා කිරීම සදහා දැඩි හා අනිවාර්ය පිලිවෙත් ක්‍රියාත්මක කිරීම හා සහතික කිරීම .

b) සේවකයන් හා ඔවුන්ගේ පවුල්වලට විශ්වීය සෞඛ්‍ය සේවා ප්‍රවේශය ලබාදීම හා කොවිඩ්-19 සදහා පරික්ෂා කිරීම හා තාවකාලික රෝහල් සියලු කාර්මික කලාප තුල ස්තාපිත කිරීම .

C) සක්‍රිය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මගින් කොවිඩ් - 19 මගින් සෘජු හා වක්‍ර පෘණාත්මක බලපෑම් ඇතිවී ඇති සියලුම වර්ගයේ ශ්‍රමිකයන් (අනියම්, ස්ථිර, අවිදිමත්, පෘතුමය, සංක්‍රමණික, ගෘහස්ත) සදහා සමාජ ආරක්ශන පිලිවෙත් හෙවත් සේවා වියුක්ති ප්‍රතිලාභ, සාමාජිය සහය, ප්‍රජා සෞඛ්‍ය නියුක්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම .

## 2) සන්නාම සැපයුම්කරුවන්ගෙන් කරන ඉල්ලීම

ඇඟලුම් ශ්‍රමිකයන්ගේ සේවය මගින් ලාභය උපයු ඇඟලුම් සන්නාම හා සැපයුම්කරුවන්ගෙන් අප පහත පියවරයන් ගන්නා ලෙස ඉල්ලා සිටිමු. එමගින් මෙම ව්‍යාපාර ඇතිවන මූල්‍ය බර ශ්‍රමිකයන් විසින් උසුලා ගැනීම සිදු නොවනු ඇත.

a) ශ්‍රමිකයන්ගේ වෘත්තීය සුරක්ෂිතභාවය හා සෞඛ්‍ය කොවිඩ්-19 වන සෘජු සෞඛ්‍ය බලපෑම් අඩු කිරිම සදහා සන්නාමයන්ගේ දැඩි අධීක්ෂණය යටතේ, සැපයුම්කරුවන් අනිවාර්යයෙන්ම WHO යෝජනා හා මාර්ගෝපදේශයන් ක්‍රියාත්මක කිරිම මගින් රැකියා ස්ථානයේ කොවිඩ් - 19 ට නිරාවනය වීම වැලැක්වීම මේ සදහා පහත නිර්දේශ ඇතුළත් වන අතර එම නිර්දේශ වලට පමනක් සීමා නොවෙයි .

* රෝගී සේවකයන් නිවසේ රැදීම සක්රියව අනුබලදීම හා කොවිඩ්-19 ලක්ෂණ සහිත සේවකයන් සදහා වැටුප් සහිත නිවාඩු ලබා දීම. කොවිඩ්-19 ලක්ෂණ සහිත නමුත් සැපයීම කල නොහැකි සේවකයන්ට ද ලබා දිය යුතුය .

* රෝගී වූ විට නිවසේ රැදීම හා කැස්ස කිවිසීම හා සේදීම ආදිය අනුගමනය කලයුතු සෞඛ්‍ය පුරුදු ඇතුළත් දැන්වීම් කර්මාන්තශාලාවල ඇතුල්වන දොරටු හා සේවකයන් ගැවසෙන ස්ථානවල ප්‍රදර්ශණය කිරිම .

* මෙම වසංගතය හමුවේ මූල්‍යමය ලෙස ශ්‍රමිකයන්ට ආධාර කිරිම සදහා සන්නාම විසින් කොවිඩ්-19 ශ්‍රමිකයන්ගේ ආරම්භ කල යුතුය. මෙය සැපයුම් දාමයේ සිටින හා ස්වයං නිරෝධායනය විය යුතු හෝ රෝගී පවුලේ සාමාජිකයන් සදහා උවටැන් කිරීමට නිවාඩු ලබාගත යුතුවන ඇතුළත් වන අතර අඩි අවදානම් සහිත සේවකයන් නිරෝදායනය කිරීමේ දී ඔවුන්ගේ වැටුප් පවත්වාගෙන යාමද සිදුකල හැක.

* කොවිඩ්-19 නිසා කිසිදු ආකාරයේ යෝජිත වෙනස් වීමකදී එනම් රැකියා වියුක්ත කිරිම, දරිද්‍රතාවය අඩු කිරිම, සේවා ස්ථාන වසා දැමීම ආදිය සිදු කිරීමට පලමුව, සන්නාම හා සැපයුම්කරුවන් විසින් කල් ඇතිව වෘත්තීය සමිති සේවයන්ගෙන් විමසිය යුතුය.

* සැපයුම්කරුවන් විසින් වෘත්තීය සමිති හා සේවකයන්ගේ සහභාගීත්වය සහිතව අවදානම තක්සේරු කල යුතු අතර කොවිඩ්-19 ආසාදනය වීම කුමන ක්‍රියාකාරකම් අවම කල යුතුද ප්‍රමාද කල යුතුද, නවතා දැමිය යුතු ද යන්න තීරනය කල යුතුය . මෙම ක්‍රියා පටිපාටිය සන්නාමයන් විසින් අධීක්ෂණය කල යුතුය.

* සියලු සේවකයින්ගේ ශරීර උෂ්ණත්වය මැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

* ප්‍රමාණවත් සබන්, ඇල්කොහොල් අඩංගු විස බීජ නාශක දියර සහ ජල පහසුකම් දෑත් සේදීම සඳහා ස්ථාපිත කිරීම සහ එම ද්‍රව්‍ය අවශ්‍ය පරිදි පවත්වාගෙන යාම ඒ අතර තප්පර 20ක අවම ලෙස දෑත් පිරිසිදු කිරීම සහ ඇල්කොහොල් 60 - 90% අඩංගු නාශක දියර මගින් දෑත් පිරිසිදු කිරීමට සේවකයින්ට උපදෙස් ලබා දීම

* රැකියා ස්ථානයේ අධිකව ස්පර්ශවන මතුපිටවල් නිතර ක්‍රමානුකූලව පිරිසිදු කිරීම

* පිරිසිදු කරන සේවකයින් රුධිරය, ශරීර ශ්‍රව්‍ය සහ අනෙකුත් ආසාදනය විය හැකි ද්‍රව්‍ය සහ අවදානම් රසායනයක් සඳහා නිරාවරණය වීම වැළැක්වීම සහතික කිරීම.

## b) ශ්‍රමිකයන්ගේ ආදායම සහ රැකියා සඳහා සහය වීම.

සන්නාම සහ ඒවායේ සැපයුම්කරුවන් විසින් රැකියා නැති වීම වැඩ කරන කාලය අඩුවීම, ගිවිසුම්වලට ස්වභාවය මත හෝ නිරෝධායන හෝ ස්වයං හෝ උපදේශය මත ව්‍යාපාර වසා දැමීම ආදිය මගින් වන මූල්‍ය හානීන් මගින් ආරක්ෂා කිරීම සඳහා සහතික කිරීම.

මෙම වසංගතය හමුවේ මූල්‍යමය ලෙස ශ්‍රමිකයන්ට ආධාර කිරීම සඳහා සන්නාම විසින් කොවිඩ්-19 ශ්‍රමිකයන්ගේ අරමුදලක් පිහිටුවිය යුතුය. මෙය සැපයුම් දාමයේ සිටින ස්වයං නිරෝධානය විය යුතු හෝ රෝගී පවුලේ හා සාමාජිකයන් සඳහා උවටැන් කිරීමට නිවාඩු ලබාදිය යුතු වන සේවකයින් නිරෝධානය සඳහා යොමු කිරීමේ දී ඔවුන්ගේ වැටුප් පවත්වාගගෙන යාම ද සිදු කළ හැක.

කොවිඩ්-19 නිසා සිදුවන රැකියා සිදු කරන කිසිදු ආකාරයේ යෝජිත වෙනස් වීමකදී එනම් රැකියා වියුක්ත කිරීම, ධාරිතාවය අඩු කිරීම, සේවා ස්ථාන වසා

දැමීම ආදිය සිදුකිරීමට පළමුව, සන්නාම සහ සැපයුම්කරුවන් විසින් කල් ඇතුව වෘත්තීය සමිති සේවකයින්ගෙන් විමසිය යුතුයි.

සැපයුම්කරුවන් විසින් වෘත්තිය සමිති සහ සේවකයින්ගේ සහභාගීත්වය සහිතව අවදානම තක්සේරු කිරීම් කළයුතු අතර කොවිඩ්-19 ආසාදිත වීම අවම කිරීම සඳහා කුමන ක්‍රියාකාරකම් අවම කළ යුතු ද , ප්‍රමාද කළ යුතු ද හෝ නවතා දැමිය යුතුද යන්න තීරණය කළ යුතුය. ක්‍රියා පටිපාටිය සන්නාමයන් විසින් අධීක්ෂණය කළ යුතුය.

* කොවිඩ්-19 පැතිරිම, ආසාදනය වීමේ අවදානම නිසා කිසියම් සේවකයෙක් ඒ පිලිබඳ කතා කිරීම හෝ කල යුතු කාර්ය ප්‍රතික්ෂේප කරන ලද විටක දී සන්නාම හා සැපයුම්කරුවන් එවැනි සේවකයන් ඉවත් කිරිම හෝ දඩුවම් ලබාදීම නොකරන බවට සහතික විය යුතුය.

රජයන්, සන්නාම හා සැපයුම්කරුවන්ගෙන් අප ඉල්ලා සිටිනවා සහයෝගය හා වගකීම් දරා ගැනීම මගින් මෙම දුශ්කර කාල සමයේ යෝජිත ඉහත පියවර ගැනීම මගින් කොවිඩ්-19 නිසා වන සෞඛ්‍ය හා ආර්ථික බලපෑම අවම කරගන්නා මෙන්ම එසේම මෙම වසංගතය නිසා දිගුකාලීනව ඇතිවිය හැකි බලපෑම් අපට ජයගත හැක්කේ මෙවැනි හා මහා පරිමානයේ පියවර ගැනීමෙන් පමණි .